ප්‍රවෘත්ති අධ්‍යක්ෂ /ප්‍රවෘත්ති සංස්කාරක **2017 දෙසැම්බර් 21**

# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2017 නොවැම්බර්

### ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

### ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය

දුරකථනය: 011-2147414 ෆැක්ස්: 011-2877945 ඊමේල්: prices@statistics.gov.lk

ජාතික පාරිභෝගික මිල දර්ශකය නිකුත් කරමින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය අමර සතරසිංහ මහතා 2017 ඔක්තෝම්බර් මාසයේ 8.8% ක්ව පැවති ලක්ෂ්‍යමය උද්ධමනය 2017 නොවැම්බර් මාසයේදී 8.4% ක් දක්වා අඩු වූ බව ප්‍රකාශ කලේය. 2017 නොවැම්බර් මාසයේ වාර්තා වූ උද්ධමනය සඳහා ප්‍රධාන වශයෙන් 2016 නොවැම්බර් මාසයේ පොල්, සහල් සහ එළවළුවල පැවැති අඩු මිල මට්ටම් හේතු වී ඇත. මෙම වර්ෂයේ නොවැම්බර් මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ 6.9%ක හා ආහාර නොවන කාණ්ඩයේ 1.5%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. එහෙත් 2016 නොවැම්බර් මාසයේ ආහාර කාණ්ඩයේ මිළ ගණන් පහළ මට්ටමක පැවතීම නිසා එම මාසයේ මතුපිට උද්ධමනය 4.1%ක් වූ අතර ඒ සඳහා ආහාර කාණ්ඩයේ දායකත්වය 0.7%ක් හා ආහාර නොවන කාණ්ඩයේ දායකත්වය 3.4%ක් විය.

කෙසේ නමුත් ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සංසන්දනය කළවිට, 2017 ඔක්තෝම්බර් මාසයේ 124.8ක් වූ දර්ශක අගය 2017 නොවැම්බර් මාසයේ 126.4ක් දක්වා ඉහළ යාමක් වාර්තා විය. පසුගිය මාසය හා සංසන්දනය කල විට 2017 නොවැම්බර් මාසයේ දර්ශකාංක 1.6ක වැඩිවීමක් හෝ 1.3ක ප්‍රතිශතකාංක වැඩිවීමක් වාර්තා විය. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.95%කින් වැඩිවීම හා ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.30%කින් වැඩිවීම බලපා ඇත.

ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම වැඩිවීම සඳහා පොල්, අමු මිරිස්, එළවළු, ලොකුළූණු, රතුළූණු, සහල්, බිත්තර සහ තේ කොළ යන ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීම බලපා ඇත. එසේ වුවත් අළුත් මාළු, කෙසෙල්, අර්තාපල්, පැපොල්, දෙහි අඹ, කරවල, මයිසූර් පරිප්පු සහ පොල්තෙල් යන ආහාර ද්‍රව්‍යවල මිල අඩුවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සසඳන කල 2017 නොවැම්බර් මාසයේ ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම වැඩිවීම සඳහා 'සෞඛ්‍ය', 'විවිධ භාණ්ඩ හා සේවා', 'විනෝදාත්මක හා සංස්කෘතික', 'ප්‍රවාහන', 'රෙදිපිළි හා පාවහන්', ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු' සහ 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන' යන කාණ්ඩවල වියදම්වල වටිනාකම වැඩිවීම බලපා ඇත. තවද 'ආපනශාලා හා හෝටල්' යන කාණ්ඩයේ වියදම්වල වටිනාකමෙහි සුළු වැඩිවීමක් වාර්තා වේ. එසේ වුවත් මෙම මාසය තුළ 'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය' යන කාණ්ඩයේ වියදම්වල වටිනාකමෙහි සුළු අඩුවීමක් වාර්තා වේ. 'සන්නිවේදන' සහ 'අධ්‍යාපන' යන කාණ්ඩවල වියදම්වල වටිනාකම නොවෙනස්ව පැවතුණි.




**ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2013 = 100)**

| වර්ෂය | මාසය | දර්ශකාංකය | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | ලක්ෂ්‍යමය උද්ධමනය (%) |
|---|---|---|---|---|
| **2016** | නොවැම්බර් | 116.6 | 1.7 | 4.1 |
| | දෙසැම්බර් | 118.0 | 1.2 | 4.2 |
| **2017** | ජනවාරි | 119.3 | 1.1 | 6.5 |
| | පෙබරවාරි | 119.9 | 0.5 | 8.2 |
| | මාර්තු | 119.5 | -0.3 | 8.6 |
| | අප්‍රේල් | 121.0 | 1.3 | 8.4 |
| | මැයි | 121.8 | 0.7 | 7.1 |
| | ජූනි | 123.4 | 1.3 | 6.3 |
| | ජූලි | 122.4 | -0.8 | 6.3 |
| | අගෝස්තු | 122.3 | -0.1 | 7.9 |
| | සැප්තැම්බර් | 123.3 | 0.8 | 8.6 |
| | ඔක්තෝම්බර් | 124.8 | 1.2 | 8.8 |
| | නොවැම්බර් | 126.4 | 1.3 | 8.4 |